**ලංකා හොස්පිටල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2017**

**----------------------------------------------------------------------------**

2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා හොස්පිටල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි ("සමාගම") මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාගමේ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් වූ මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ ඇතුළත් වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම**

**----------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය ") වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**--------------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**-----------------**

**2.1 මතය**

**------**

සමාගම විසින් 2017 ජුනි 28 දින පවත්වන ලද වාර්ෂික මහා සභා රැස්වීමේදී පෞද්ගලික විගණන සමාගමක් වන කේපීඑම්ජී (වරලත් ගණකාධිකාරී) සමාගම පත්කර ඇති බැවින්, ලංකා හොස්පිටල් ඩයග්නෝස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්හි විගණන මතය කේපීඑම්ජී සමාගම විසින් නිකුත් කර තිබුණි. කේපීඑම්ජී සමාගම විසින් හැර මතයක් 2018 මාර්තු 28 දින නිකුත් කර තිබුණි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම්

### 2.2.1 සාක්ෂි නොමැති වීම

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ණයගැතියන් හා ණයහිමියන්ගෙන් තෝරාගන්නා ලද නියැදිය අතරින්, පිළිවෙලින් රු.10,236,012 ක් සහ රු.12,793,744 ක් වූ ණය ගැතියන් හා ණයහිමියන්ගේ නිවැරදිතාවය හා පැවැත්ම, ඍජු තහවුරු කිරීම් නොමැතිවීම හේතුවෙන් විගණනයේදී තහවුරු කළ නොහැකි විය.

### 2.2.2 නොසැසඳු වෙනස්කම්

ලද තහවුරු කිරීම් හා සැසඳීමේදී, පොදු ලෙජරයෙහි දක්වන ලද ණයහිමි ශේෂ හා අදාළ පාර්ශවයන් විසින් තහවුරු කරන ලද ශේෂ අතර වෙනස්කම් නිරීක්ෂණය විය. විස්තර පහත පරිදි වේ.

| ණය හිමියාගේ නම | ලෙජරය අනුව මුදල | තහවුරු කිරීම අනුව මුදල | වෙනස |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| එමර් ෆාමා (ප්‍රයිවට්) ලිමිටඩ් | 3,303,730 | 2,793,635 | 510,095 |
| ජේ.එල්.මොරිසන් ඇන්ඩ් සන්ස් ලිමිටඩ් | 21,408,782 | 21,585,601 | 176,819 |

## 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

2017 දෙසැම්බර් 31 දිනට වූ ණය හිමි කාල විශ්ලේෂණය තුළ අන්තර්ගත රු.1,165,664 ක් වූ අත්තිකාරම් පෙරගෙවුම් ණයහිමි ශේෂ ලෙස හඳුනාගෙන තිබුණි.

## 2.4 අක්‍රීය ගිණුම්

එකතුව රු.259,872 ක් වූ ලැබුණු අත්තිකාරම් ශේෂයන් හා ගෙවිය යුතු පරීක්ෂණ ගාස්තු දීර්ඝ කාලයක සිට වෙනසක් නොකර ගිණුම්වල පැවති අතර එම ශේෂයන් නිරවුල් කිරීම සඳහා සමාලෝචිත වර්ෂයේදීද කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.208,768,600 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ සමාගමෙහි බදු පෙර ශුද්ධ ලාභය රු. 265,688,811 ක් වූයෙන්, බදු පෙර ලාභය රු.56,920,211 කින් අඩු වී තිබුණි. සමාගමේ දුර්වල කාර්යසාධනය, වර්ෂයේ සියයට 21.4 ක් වූ බදු පෙර ලාභයේ අඩුවීමට මූලිකව හේතු වී තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

-----------------------------------------

**මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශය**

----------------------------------

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වූ සමාගමේ මූල්‍ය ප්‍රතිඵලවල සාරාංශය පහත වගුව මගින් දැක්වේ.

| | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය | |
|---|---|---|
| | 2017 | 2016 |
| | ‘000 | ‘000 |
| | රු. | රු. |
| ආදායම | 1,156,505 | 984,358 |
| සේවා පිරිවැය | (582,489) | (418,234) |
| දළ ලාභය | 574,016 | 566,124 |
| අනෙකුත් ආදායම් | 52,500 | 15,000 |
| පරිපාලන වියදම් | (312,784) | (266,247) |
| අනෙකුත් මෙහෙයුම් වියදම් | (103,442) | (59,709) |
| මූල්‍ය ආදායම | 50,927 | 25,506 |
| බදු පෙර ලාභය | 208,769 | 265,689 |
| ආදායම් බදු වියදම | (36,897) | (16,057) |
| වර්ෂය සඳහා ලාභය | 171,872 | 249,631 |

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**---------------------------------------**

වෛද්‍යවරයාගේ අදහස් දැක්වීම් පාදක කරගෙන රසායනාගාර පරීක්ෂණ සඳහා කල්ඉකුත් වූ ඖෂධ භාවිතා කිරීම, සමාගම විසින් සාමාන්‍යයෙන් අනුගමනය කරනු ලබන පිළිවෙතයි.

තාක්ෂණික වලංගුකරණයකින් අනතුරුව කල් ඉකුත් වූ තොග අයිතම භාවිතා කළ හැකි බවත් එය කර්මාන්ත පිළිවෙතක් බවත්, කල් ඉකුත් වූ අයිතමයන් භාවිතා කිරීමේදී අනුගමනය කළ යුතු විධිමත් සම්මත මෙහෙයුම් ක්‍රියාපරිපාටි (SOP) තමන් සතුව පවතින බවත් සභාපතිවරයා දන්වා තිබුණි.
තවද, 2015 දෙසැම්බර් 31 දින සිට රු.773,122 ක ප්‍රතිපාදන මූල්‍ය ප්‍රකාශනවල සලසා තිබුණි.